# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,136 - 2019 අගෝස්තු මස 09 වැනි සිකුරාදා - 2019.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1414 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1429 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1432 |


*සැ. යු.* - (i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූලි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූලි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1413 - B 81550— 5,403 (2019/08)

# තනතුරු - ඇබෑර්තු

## සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ සීතාවකපුර නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ අවම සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව, සකස් කරගත් අයදුම්පත්‍ර (12" x 8" ප්‍රමාණයේ) "ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල යන ලිපිනයට 2019.09.06 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියැදුරු | 01 | රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990<br>PL-3 - 2016<br>(රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලබේ.) | I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් 06 සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් ව තිබිය යුතුය.)<br><br>II. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)<br><br>III. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br><br>IV. බලපත්‍රය ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.<br><br>V. අවම උස අඩි පහක් (05' ) විය යුතුය.<br><br>VI. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | කාර්යාල කාර්ය සහායක | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>PL-1 - 2016<br>(රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 සමත් වී තිබීම. මින් විෂයන් පහ (05) ක් එකවර සමත්විය යුතුය. (බඳවා ගැනීමේදී අ.පො.ස (සා.පෙළ) සමත් අය නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීම සඳහා සළකා බලනු ලැබේ.) |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>PL-1 - 2016<br>(රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලබේ.) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |
| 04 | සෞඛ්‍ය කම්කරු | 07 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>PL-1 - 2016<br>(රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලබේ.) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

03. *වයස් සීමාව :*

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

01. පහත I, II, III හි සඳහන් සියලුම බඳවා ගැනීම් රා.ප.චක්‍රලේඛ අංක 24/95 අනුව සිදු කරනු ලැබේ.

I. රියැදුරු තනතුර සඳහා වෘත්තීය පරීක්ෂණයක් මගින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.

II. පහත II, III හි සඳහන් සියලුම බඳවා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ.

(1) රියැදුරු තනතුර

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 50% |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු | 100 | |

(II) කාර්යාල කාර්ය සහයක තනතුර :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(III) වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර/සෞඛ්‍ය කම්කරු තනතුර :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්/ආදේශ/කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධ්‍ය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදයක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි.

(iv) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසි වලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

06. *පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වූ වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(iv) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන 2019.09.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *කොන්දේසි :*

(i) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සීතාවකපුර නගර සභාවේ ලේකම් සතුය.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල සහතික කළ පිටපත් ස්වකීය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. :-

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පතේ පිටපත/ගමන් බලපත්‍රයේ පිටපත,
(iii) මෑතකදී (මාස 06ක් තුළ) ලබා ගත් චරිත සහතික 02 ක්,
(iv) පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී (මාස 06ක් තුළදී) ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
(v) වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත (රියදුරු තනතුර සඳහා පමණි.),
(vi) අධ්‍යාපන සහතික හා වෘත්තීය සහතික,
(vii) පළපුරුද්ද පිළිබඳ සහතික.

එන්. ඊ. ඒ. ඩී. ටී. පෙරේරා,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2019 ජූලි මස 23 වැනි දින,
සීතාවකපුර නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල***

*බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ .............................................තනතුර සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම :——————————

මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————

03. ස්ථිර ලිපිනය :——————————

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

05. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————

06. විවාහක/අවිවාහක බව:——————————

07. උපන් දිනය :——————————

2019.09.06 දිනට වයස :

අවුරුදු :———— මාස :———— දින :————

08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචියෙන් ද? :————

09. අධ්‍යාපන සුදුසුකම්: (සමත් වූ විභාගය පිළිබඳ විස්තර)

I. සමත් වූ වසර/ශ්‍රේණිය :——————

II. අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාග වර්ෂය හා මාසය :——————

විභාග අංකය:——————

සමත් වූ විෂයයන්:

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

විභාග වර්ෂය හා මාසය:——————

විභාග අංකය:——————

සමත් වූ විෂයයන්:

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————

11. ඔබ ඉල්ලුම් කරන තනතුරේ සේවා පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුයි) :——————

12. සේවා පළපුරුද්ද :——————

(i) දැනට සේවය කරන ආයතනය :——————

(ii) දැනට දරන තනතුර :——————

(iii) එම තනතුරට පත් වූ දිනය :——————

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන තිබේනම් එම ස්ථාන හා දරන ලද තනතුරු :——————

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :——————

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................

08-323

## කුලියාපිටිය නගර සභාව

කුලියාපිටිය නගර සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

**01. ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ රියදුරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව 02**

වැටුප් ක්‍රමය : - PL-3- 2016
රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990

01. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) බාහිර අයදුම්කරුවන් සඳහා :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්වීම (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතුය.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :
දැනට කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ගණයේ (PL) ස්ථිර තනතුරක සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන්, රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

02. *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

තාර බර හොන්ඩර 34 ට වැඩි, බර මෝටර් වාහන, බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳව සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

03. *පළපුරුද්ද :*

පිළිගත් ආයතනයක වාහන රියැදුරෙකු ලෙස වසර 03 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. ට්‍රැක්ටර් වැනි ටේ්‍රලර් සහිත වාහන ධාවනය කිරීම සඳහා ලබා ඇති පළපුරුද්ද සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. (ඒ බව සේවා සහතික මගින් සනාථ කළ යුතුය)

**02. ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ බර වාහන, යන්ත්‍ර ක්‍රියාකරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව - 02**

*වැටුප් ක්‍රමය:* - PL-3- 2016
රු. 25,790 - 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990

01. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) බාහිර අයදුම්කරුවන් සඳහා :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත් වීම. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතුය.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :
දැනට කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ගණයේ (PL) ස්ථිර තනතුරක සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් රජයේ අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

02. *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

තාර බර හොන්ඩර 34 ට වැඩි, බර මෝටර් වාහන, බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳව සහතිකයක් ලබා තිබිය යුතුය. (Aපන්තියේ රියදුරු බලපත්‍රයක්)

03. *පළපුරුද්ද :*

පිළිගත් ආයතනයක බර වාහන හෝ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වසර 03 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. ඒ බව සේවා සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.

**03. ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ ජල නළ වැද්දුම්කරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

වැටුප් ක්‍රමය - PL3- 2016

රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 -12 x 350 - රු. 38,990

01. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) බාහිර අයදුම්කරුවන් සඳහා :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත් වීම (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතුය.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

දැනට කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ගණයේ (PL) ස්ථිර තනතුරක සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

02. *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

03. *පළපුරුද්ද :*

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම. (ඒ බව සේවා සහතික මගින් සනාථ කළ යුතුය)

**04. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ ජල පොම්ප ක්‍රියාකරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව 02**

වැටුප් ක්‍රමය - PL-2- 2016

රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

01. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) බාහිර අයදුම්කරුවන් සඳහා :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

දැනට කුලියාපිටිය නගර සභාවේ ප්‍රාථමික ගණයේ (PL) ස්ථිර තනතුරක සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන්, රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

02. *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 2 හෝ NVQ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබිය යුතුය.

03 . *පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.)

**05. ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ,**

(i) වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව 01

(ii) සෞඛ්‍ය කම්කරු තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව 11

*වැටුප් ක්‍රමය* - PL- 1- 2016

රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410

01. අධ්‍යාපන සුදුසුකම් :

(අ) රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම හෝ ඊට ඉහල අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබිය යුතුය.

**06. ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ,**

| | | | |
|---|---|---|---|
| i. | ජල කම්කරු තනතුර | - | පුරප්පාඩු සංඛ්‍යාව 01 |
| ii. | මුරකරු තනතුර | - | පුරප්පාඩු සංඛ්‍යාව 02 |
| iii. | කාර්යාල කාර්ය සහායක තනතුර | - | පුරප්පාඩු සංඛ්‍යාව 02 |

වැටුප් ක්‍රමය - PL1-2016

රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410

01. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතුයිඃ

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර ඒ බව අයදුම්කරුවන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද සහතිකයක් මගින් සනාථ කළ යුතුය.
3. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
5. දැනටමත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමක් ලබා නොතිබිය යුතු අතර එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.
6. වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අයකු විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

*සේවා කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම තනතුරුවලට තෝරාපත්කරගනු ලබන්නන්, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, වයඹ පළාත් මූල්‍ය රීති, නගර සභා ආඥාපනතේ විධිවිධාන, රජය/වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛවල විධිවිධාන/රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට යොමු කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ. රියදුරු, බර යන්ත්‍ර ක්‍රියාකරු ජන නළ වැද්දුම්කරු සහ ජල පොම්ප ක්‍රියාකරු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයට සහ ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

*අයදුම් කළ යුතු ආකාරය :*

මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කර සකස් කරගන්නා අයදුම්පත් 2019.08.30 දිනට පෙර ''ලේකම්, නගර සභාව, කුලියාපිටිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම් කරන තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර, අසම්පූර්ණ අයදුම්පත්‍ර හා මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තනතුරු කීපයක් සඳහා අයදුම්කරන්නන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. (සියලුම පිටපත්, සත්‍ය පිටපත් බවට අයදුම්කරු විසින්ම සහතික කර තිබිය යුතුය.)

i. උප්පැන්න සහතිකයේ පිටපත,

ii. අධ්‍යාපන සහතිකවල පිටපත්,

iii. පදිංචිය සනාථ කිරීම පිණිස අයදුම්කරුවන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද සහතිකයෙහි පිටපතක්,

iv. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක පිටපත්,

v. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා/පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්,

vi. රියදුරු තනතුර සඳහා වලංගු රියැදුරු බලපත්‍රයෙහි පිටපත,

vii. ජාතික හැඳුනුම්පතෙහි පිටපත,

viii. ස්ථිර පදිංචි ස්ථානය සඳහා නගර සභාව වෙත අවසන් වරට වරිපනම් බදු ගෙවීමේ දී නිකුත් කළ බිල්පතෙහි පිටපතක්.

මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් සහ තනතුරු සඳහා පත්කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ සියලුම බලතල පත් කිරීමේ බලධාරියා වශයෙන් මා සතු වන බව ද, වැඩිදුරටත් දන්වා සිටිමි.

එච්. එම්. පී. කේ. හේරත්,
ලේකම්. (*වැඩ බලන*),

2019 ජුලි මස 22 වැනි දින,
නගර සභාව - කුලියාපිටිය.

ආදර්ශ අයදුම්පත්‍රය

**කුලියාපිටිය නගර සභාවේ.......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. *(අ)* මුලකුරු සමඟ නම :——————————

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————

02. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————

03. ලිපිනය :——————————

04. ස්ථිර පදිංචි ස්ථානය සඳහා නගර සභාව වෙත වරිපනම් බදු ගෙවීමට අදාළ අංකය:——————————

05. උපන් දිනය:........................ (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

06. 2019.08.30 දිනට වයස අවු.:—————— මාස:—————— දින:——————

07. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

08. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————

(පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරනු ලැබූ සහකිකයේ පිටපතක් ඇමිණිය යුතුයි):——————————

09. කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය:——————————

10. විවාහක/අවිවාහක බව:——————————

11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග:——————————

12. *අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේ දී විභාග අංකය/විභාගය පැවැත්වූ වර්ෂය සඳහන් කරන්න. ප්‍රතිඵල ලේඛනයේ පිටපත් ඉදිරිපත් කළ යුතුයි. )

විභාග අංකයː——————— වර්ෂය ː———————

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම්ː——————————————
14. වෘත්තීය හා සේවා පළපුරුද්ද (සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුයි)ː——————————————
15. රියදුරු බලපත්‍රයේ අංකය (රියැදුරු තනතුර සඳහා පමණක්)ː—————————— (බලපත්‍රයේ පිටපත ඇමිණිය යුතුයි)
16. වෙනත් සුදුසුකම් ː (සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුය) ː——————————————
17. මීට පෙර කවරදාක හෝ උසාවියකින් වරදකරු වී තිබේද? ː—————————— ඔව් නම් ඊට අදාළ කරුණු ඉදිරිපත් කරන්න.ː——————————
18. මීට පෙර රජයේ රැකියාවක් කර එයින් ඉවත් වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර ː——————————————
19. දැනට රජයේ හෝ පළාත් සභාවක ස්ථිර/අනියම්/ආදේශක තනතුරක සේවය කරන්නේ නම් ඒ පිළිබඳව විස්තරː——————————
(ඒ බව සේවා සහතිකයක් මඟින් සනාථ කළ යුතු අතර එහි පිටපත් ඇමිණිය යුතුයි)

ඉහත සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බවත්, මෙම කරුණු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන බවත්, තනතුර දරන අවස්ථාවක නම්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මා දනිමි.

.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය .....................................

20. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිරත වූ අයදුම්කරුවන් සඳහා ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහිතකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ. ........................................................ ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

....................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම ː..............................................................
තනතුර ː...........................................................
ලිපිනය ː (නිල මුද්‍රාවෙන් සනාථ කරන්න) ː

දිනය ː............................... .

08-274

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක - III | 01 | PL1 - 2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයන් හය (06) සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) ක් එකවර සමත් විය යුතුය.) |
| 02 | සෞඛ්‍ය කම්කරු - III | 02 | PL1 - 2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

02. *කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.
IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස* .- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණක් පවත්වා වැඩීම ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2019.08.31 හෝ එදිනට පෙර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
II. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
III. අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචි සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්ලිව්. පාලිත සිසිර කුමාර,
ලේකම්.

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,
මීගහතැන්න.

2019 ජුලි මස 30 වැනි දින,

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වලල්ලාවිට ප්‍රාදේශීය සභාව***

*වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ.......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————

03. ස්ථිර ලිපිනය :——————————

04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————

05. දිස්ත්‍රික්කය :——————————

06. උපන් දිනය : අවුරුද්ද:—————. මාසය:—————. දිනය:—————.

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.08.31) වයස : අවු.:————— මාස:————— දින:—————

08. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————

09. විවාහක/අවිවාහක යන වග:——————————

10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :——————————

11. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

12. දුරකථන අංකය:——————————

13. අධ්‍යාපන සුදුසුකම් :——————————

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

...................................;

අයදුම්කරුගේ අත්සන.

දිනය ............................. .

08-550

## මොරටුව මහා නගර සභාව

තනතුරු ඇබෑර්තු

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | වැඩ ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය) | 10 | PL 1-2016 | රු. 24,250-10x250 10x270-10x300 12x330- රු. 36,410/- | 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |
| 02. | සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | 10 | PL 1-2016 | රු. 24,250-10x250 10x270-10x300 12x330- රු.36,410/- | 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |

*බඳවා ගැනීමේ ක්‍රමය*.- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් ඃ

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවා කාලය (වසරකට ලකුණු 05) | 15 | 50 |
| ක්ෂේත්‍රයට අදාළව ලබාගත් වෙනත් බාහිර පළපුරුද්ද | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම.) | 05 | |
| මුළු ලකුණු | 100 | |

*බඳවා ගැනීමේ කොන්දේසි*.-

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
2. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබුවකු නොවිය යුතු ය.
6. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන අවශ්‍ය සියලුම සුදුසුකම් 2019.09.05 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

7. අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

8. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත්විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

2. බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

3. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කළ පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් 2019.09.05 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

2. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යවනු ලැබූ අයදුම්පත් හා මෙම දැන්වීමේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්‍ර ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ඇත.

3. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. එසේ එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   - උප්පැන්න සහතිකය,
   - අධ්‍යාපන සහතික (ප්‍රතිඵල සනාථ කිරීමේ සහතිකය ඇතුළුව),
   - ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
   - මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)
   - පොලිස් වාර්තාවක්.

4. යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවර වල බහා ඉදිරිපත් කළ යුතුය.

කේ. ඒ. තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2019 ජූලි මස 26 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහනගර සභාවේ.............................................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.

3. ස්ථිර ලිපිනය :————.

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————. දුරකථන අංකය :————.

6. උපන් දිනය ඃ අවුරුද්ද :————, මාසය :————, දිනය :————.

7. ජාතිය :————.

8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු :————, මාස :————, දින :————.

9. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචියෙන් ද ? :————.

12. අධ්‍යාපන සුදුසුකම් :————.

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.

14. වෙනත් සුදුසුකම් :————.

15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර :

I. දැනට දරන තනතුර :————.
II. අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග :————.
II. එම තනතුරට පත් වූ දිනය :————.

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ..................................................................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ .................................................................................................. වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත්, ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

08-481

# පළාත් පාලන නිවේදන

## සම්මත අතුරු ව්‍යවස්ථාව

## ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරිය වන 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ගොඩකවෙල ප්‍රාදේශීය සභාව විසින් 2018.10.18 දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 06-02 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර,
සභාපති,
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගොඩකවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

